# 1 අක්ෂර මාලාව

මිනිසා තම හැඟීම් හා අදහස් ලියා දැක්වීමට භාවිත කරන සංකේත, අක්ෂර නම් වේ. කථා ව්‍යවහාරයේ දී ශබ්ද භාවිතයට ගන්නා ඔහු ලේඛනයේ දී ඒ සඳහා යොදා ගන්නේ අක්ෂර සංකේත යි. භාෂාවක යෙදෙන මෙම සංකේත සිංහලයේ දී හෝඩිය, අකුරු, අක්ෂර, වර්ණ ලෙස හඳුන්වයි.

## 1.1 සාම්ප්‍රදායික සිංහල අක්ෂර මාලාව

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ | ඍ | ඎ |
| ඏ | ඐ | එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ | | |

| | | | | |
|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ |
| ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | ඨ | ඩ | ඪ | ණ |
| ත | ථ | ද | ධ | න |
| ප | ඵ | බ | භ | ම |
| ය | ර | ල | ව | |
| ශ | ෂ | ස | හ | ළ |
| (අ)ං | (අ)ඃ | | | |

ඉහත දැක්වූයේ සාම්ප්‍රදායික සිංහල හෝඩියට අයත් අක්ෂර මාලාව යි. එය ප්‍රමාණයෙන් අක්ෂර පනස් හතරකින් (54) යුක්ත ය. එහෙත් නූතන සම්මත අක්ෂර මාලාවේ අක්ෂර හැටක් (60) දක්නට ඇත. ඒ අර්ධානුනාසික හෙවත් සඤ්ඤක යනුවෙන් හැඳින්වෙන

ඟ ඦ ඬ ඳ ඹ

යන අක්ෂර පහ සහ ෆ යන නව අක්ෂරය, අක්ෂර මාලාවට එකතු කිරීමෙනි. පහත දැක්වෙන්නේ ඒ අක්ෂර මාලාව යි.

## 1.2 නූතන සිංහල අක්ෂර මාලාව

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

මෙයින් ඏ ඐ යන අක්ෂර දෙක සාම්ප්‍රදායික අක්ෂර මාලාවට අයත් වුව ද, නූතන සිංහලයේ භාවිත නොවේ.

## අවධානයට

වසර දෙදහසකටත් වැඩි ඉතිහාසයක් තිබෙන සිංහල භාෂාව අපේ මවුබස යි.
අපේ මුතුන්මිත්තන් ඈත
අතීතයේ සිට ම ලියන්නට,
කියවන්නට දැන සිටීම
අපට මහත්
අභිමානයකි.
එය ඉදිරියට ද පවත්වාගෙන
යෑමට නම්, අප කළ යුත්තේ අපේ
භාෂාව හොඳින් ඉගෙන ගැනීම යි.
එහි දී අපේ පළමු පියවර
වන්නේ අක්ෂර මාලාව
මනා ව හැඳින ගෙන
ප්‍රගුණ කිරීම යි.

ක්‍රියාකාරකම 01

භාෂා හුරුව

පහත සඳහන් ඡේදය ශබ්ද නගා කියවන්න. පිටපත් කරන්න.

"................... ගුවන් කුස ගමන් ගෙන, එ වෙන් මග කෙමෙන් ගොස් අඹර සිට රඹගම් නුවරවර වොරදනා නේදනා සතොසිනා මඟ තනා යන එනා දකිමිනා ගුවනිනා බසිමිනා, ඒ දන වෙතට ගොස් " අද දවස් වෙමින් තොස් මඟ සකස් කුම් උදෙස් කරනුව" යි එ පිළිවිස් ඒ තවුස්හට එ තැන් පත් එ සත් හැම " මෙ වන් යුත් මෙ මාවත් මොහ'ඳුරා කළ දුරා පැණසරා තවසරා මොකැඳුරා පියකරා සෙත් කරා දෙස්වරා මෙත්කරා දිවකුරා ලොවුතුරා මුනිවරා ඉසිවරා පිරිවරා සැරිසරා මෙ නුවරා හවිනරා මන් පුරා පින් පුරනුවස් වඩිනු වස්.........................."

-දළදා සිරිත-

**ක්‍රියාකාරකම 02**


i. අක්ෂර මාලාවේ <u>සමාන හැඩ</u> ඇති අක්ෂර තෝරාගෙන වගුවක් පිළියෙල කරන්න. උදාහරණ 1). ක ග හ න

2). අ උ ද ල

ii. "ට" අක්ෂරය ලිවීමේ දී දකුණෙන් පටන් ගෙන වමෙන් අවසන් වේ. "න" අක්ෂරය ලිවීමේ දී වමෙන් පටන් ගෙන දකුණෙන් අවසන් වේ. එසේ වමෙන් හා දකුණෙන් පටන් ගන්නා වෙනත් අකුරු තෝරා ලියන්න.

**ක්‍රියාකාරකම 03**

අක්ෂර මාලාවේ පිළිවෙළ අනුව අඩු අකුරු පුරවන්න.




## 1.3 අක්ෂර ප්‍රභේද

සිංහල අක්ෂර මාලාවේ ප්‍රධාන ප්‍රභේද දෙකකි.

- ස්වර
- ව්‍යඤ්ජන වශයෙනි.

අක්ෂර මාලාවේ අ සිට ඖ දක්වා ඇති අක්ෂර දහඅට ස්වර වේ. මේවා ප්‍රාණාක්ෂර, පණකුරු, සරකුරු, සර, සොරකුරු යනුවෙන් ද හැඳින්වේ. මෙම අක්ෂර වෙනත් අකුරක ආධාරයෙන් තොර ව, තනි ව ශබ්ද කළ හැකි ය.

**අ ආ ඇ ඈ ඉ ඊ**

**උ ඌ ඍ ඎ ඏ ඐ**

**එ ඒ ඓ ඔ ඕ ඖ**

ස්වර අක්ෂර හ්‍රස්ව සහ දීර්ඝ වශයෙන් ද ප්‍රභේද දෙකකි.

ස්වර
- හ්‍රස්ව ස්වර - අ ඇ ඉ උ ඍ ඏ එ ඔ
- දීර්ඝ ස්වර - ආ ඈ ඊ ඌ ඎ ඐ ඒ ඕ ඓ ඖ

අක්ෂර මාලාවේ **ක** සිට **ෆ** දක්වා ඇති අකුරු හතළිහ (40) ව්‍යඤ්ජන අක්ෂර වේ. මේවා ගාත්‍රාක්ෂර, ගතකුරු, මළකුරු හා හසකුරු යනුවෙන් ද හඳුන්වයි. මේවා නිත්‍ය හල් (අල්) අකුරු වේ. මේවා උච්චාරණය පහසු වීම සඳහා ස්වර අකුරක් සමග යෙදේ.

උදා:- ක් + අ = ක
ප් + ඉ = පි

## (අ)ං (අ) ඃ සංකේත

මෙම අක්ෂර සංකේත දෙක සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අවසානයේ ද නූතන අක්ෂරමාලාවේ ස්වර අවසානයේ ද ස්ථානගත කර ඇත. ඒ අනුව මේ සංකේත දෙක සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන ලෙස නම් කර ඇතත්, නූතන අක්ෂර මාලාවේ ස්වර හෝ ව්‍යඤ්ජන වශයෙන් හඳුන්වා නැත.

(අ) ං සංකේතය හඳුන්වන්නේ "අනුස්වාරය"යනුවෙනි. ඊට හේතුව එය ස්වරයකට අනුව යෙදෙන බැවිනි.

උදා:- අං - අංකෙළිය
ඉං - සිංහල
උං - වංහුං
එං - සෙංකඩගල
ඕං - දෝංකාරය ආදි වශයෙනි.

(අ) ඃ සංකේතය ද 'අ' කාරය සමග යෙදේ.

උදා:- අඃ - මනඃකල්පිත
අඃ - වයඃ කල්‍යාණ

## ව්‍යඤ්ජන අක්ෂර මාලාව

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

| ව්‍යඤ්ජන ප්‍රභේද | | |
|---|---|---|
| | ක ඛ ග ඝ ඞ<br>ච ඡ ජ ඣ ඤ<br>ට ඨ ඩ ඪ ණ<br>ත ථ ද ධ න<br>ප ඵ බ භ ම | වර්ගාක්ෂර |
| | ඞ ඤ ණ න ම | වර්ගාන්තාක්ෂර |
| | ක ච ට ත ප<br>ග ජ ඩ ද බ | අල්පප්‍රාණාක්ෂර |
| | ඛ ඡ ඨ ථ ඵ<br>ඝ ඣ ඪ ධ භ | මහාප්‍රාණාක්ෂර |
| | ඟ ඦ ඬ ඳ ඹ | සඤ්ඤකාක්ෂර |
| | ය ර ල ව ළ | අන්තඃස්ථාක්ෂර |
| | ශ ෂ ස හ ෆ | ඌෂ්මාක්ෂර |

**ක්‍රියාකාරකම 04**

කොටුව තුළ ඇති අකුරු අතුරින් අදාළ අකුරු තෝරා වගුව පුරවන්න.

**ඟ න ච ය ශ ග ඣ ඹ ෆ ළ**
**ර ඡ ට ථ ෂ ඤ ප ක ඵ ඞ**
**ණ ඪ**

| වර්ගාන්ත | අල්පප්‍රාණ | මහාප්‍රාණ | සඤ්ඤක | අන්තඃස්ථ | ඌෂ්මාක්ෂර |
|---|---|---|---|---|---|
| | | | | | |

ක්‍රියාකාරකම 05

i. පහත සඳහන් තද කළු අකුරින් මුද්‍රණය කොට ඇති වචනවල ස්වර ව්‍යඤ්ජන වෙන් කොට දක්වන්න.

**අමිල, දේශාභිමානය, ඓතිහාසික, මහෞෂධ, වීරෝදර**

උදා : කුමුදුකර = ක් + උ + ම් + උ + ද් + උ + ක් + අ + ර් + අ

ii. පහත සඳහන් ස්වර ව්‍යඤ්ජන ඇසුරෙන් වචන ගොඩනගන්න.

උදා: **ර් + අ + ව් + ඉ + ඳ් + උ = රවිඳු**

**ස් + උ + ම් + ඉ + හ් + ඉ + ර් + අ =**

**ච් + ඉ + ස් + ත් + ඍ + ත් + අ =**

**ද් + අ + ක් + ෂ් + ඉ + ණ් + අ + ද් + ඒ + ශ් + අ + ය් + අ =**

**අ + හ් + අ + ය් + අ + හ් + ඌ + ම් + ඉ =**

**ම් + ඕ + හ් + ආ + න් + ධ් + අ + ක් + ආ + ර් + අ =**

iii. හිස්තැන් පුරවන්න.

| | |
|---|---|
| ක් + ...... = කු | ස් + ...... = සෘ |
| ...... + ඊ = පී | ප් + ඖ = ...... |
| හ් + ඖ = ....... | ..... + ඒ = ඤේ |
| ස් + ...... = සූ | ග් + ...... = ගො |

## රේඵය, රකාරාංශය සහ යංශය

රේඵය, රකාරාංශය

( ර්‍, ්‍ර )

පැරණි පොතපතෙහි ව්‍යංජන අකුරකට පෙර "ර්" කාරය යෙදෙන විට"ර්" කාරය රේඵය ( ර්‍ ) නම් සලකුණෙන් යෙදේ. උදා : ධර්මය (ධ + ර් + ම + ය )

ස්වරාන්ත "ර්" කාරය ව්‍යඤ්ජනයකට පසුව යෙදෙන විට එම අකුර යටින් "ර" කාරයෙන් අඩක් ලිවීම රකාරාංශය ( ්‍ර ) නම් වේ.

**උදා : ක්‍රමය ( ක් + ර් + අ = ක්‍ර)**

**යංශය (ය)**

ස්වරාන්ත "ය" කාරය ව්‍යඤ්ජනයක් පරව සංයුක්ත ව යෙදෙන විට "ය" කාරයේ අඩක් ව්‍යඤ්ජනය සමග බැඳ ලිවීම සම්ප්‍රදය යි. එම අර්ධ "ය" කාරය යංශය (ය) නම් වේ.

උදා : **වාක්‍යය**

**ක්‍රියාකාරකම 06**

i. පහත සඳහන් වචන රේඵය හා රකාරාංශය යොදා නැවත ලියන්න.

**තර්කය , ක්රෝධය, භ්රමණය, විසර්ගය**
**වාර්තාව, සාර්ථක, ප්රමාණය, වක්රය**
**සර්පයා, කාලත්රය**

ii. "යංශය (ය)" සහිත වචන 10ක් සොයා ලියන්න.

## 1.4 අකාරාදි පිළිවෙළ

අක්ෂර මාලාවේ "අ" සිට "ෆ" දක්වා ඇති අක්ෂර පිළිවෙළ අකාරාදිය යි. යම් වචන මාලාවක් ඒ පිළිවෙළට සකස් කිරීම අකාරාදි පිළිවෙළ යි.

පියගැටපෙළ, ආසනය, බෝධිය, විහාරය, වෙහෙර, පන්සල, මළුව, ප්‍රාකාරය යන මෙම වචන මාලාව අකාරාදි පිළිවෙළට මෙසේ සකස් කළ හැකි ය.

**ආසනය, පන්සල, පියගැටපෙළ, ප්‍රාකාරය, බෝධිය, මළුව, විහාරය, වෙහෙර**

**ක්‍රියාකාරකම 07**

පහත සඳහන් වචන සමූහ, අකාරාදි පිළිවෙළට ලියන්න.

i. නාසය, කට, අත, ඇස, කන, දිව, හිස, දත්
ii. සිවුර, අඳනය, නානකඩය, අංශකඩය, පටිය, පාත්‍රය, කුඩය, දළිපිහිය.
iii. ජේතවනාරාමය, වේළුවනාරාමය, පූර්වාරාමය, නිග්‍රෝධාරාමය, ඝෝෂිතාරාමය, කුක්කුටාරාමය, පාවාරිකාරාමය, අශෝකාරාමය

## 1.5 අක්ෂර විනයාසය




ඉහත දැක්වූයේ ලක්සිරිපුර භාෂෝදය පරිවෙණාධිපති පණ්ඩිත හාමුදුරුවන් වහන්සේ ස්ථාන කීපයක දුටුවා යැයි පැවසූ දැන්වීම් කීපයකි. ඒ ගැන උන්වහන්සේ විස්තර කරන්නට යෙදුණේ **"සිංහල භාෂා දිනය"** වෙනුවෙන් සංවිධානය කළ විශේෂ දේශනයක දී ය. ඒ දේශනයෙන් කොටසක් පහත දැක්වේ.

"........................අද අපේ රටේ ශිෂය අවදියේ සිටින්නන් විතරක් නොවෙයි, වැඩිහිටි අය පවා සිංහල භාෂාව ඉගෙනීම ගැන ලොකු උනන්දුවක් දක්වනවා.......ඒ වුණාට භාෂාව ලිවීමේදි අක්ෂර නිවැරදි ව පාවිච්චි කරන්නේ නෑ කියල යි හිතෙන්නෙ.

.......... එසේ වචනවල අක්ෂර නිවැරදි ලෙස ලියන ආකාරය තමයි අක්ෂර විනයාසය කියලා කියන්නෙ. අක්ෂර විනයාසය නිවැරැදි නැත්නම් වචනවල තේරුම වරදින්න පුළුවන් . බලන්න මේ වචන ටික ..........

| වචනය | අර්ථය |
| --- | --- |
| නුවන<br>නුවණ | ඇස<br>ඥණය |
| මල<br>මළ | පුෂ්පය<br>මැරුණු |

වැරදි ලෙස අල්පප්‍රාණ, මහප්‍රාණ අකුරු යොද ලියා ඇති, මා මුලින් කියූ දන්වීම්

පරිගණක මධ්‍යස්ථානය විවෘත කෙරේ.

පුස්තකාලයට මුල් ගල තැබේ.

ත්‍යාග ප්‍රදානෝත්සවය ප.ව. 3 ට ඇරඹේ.










........... මේ විදිහට පුළුවන් තරම් නිවැරැදි ව වචන ලියන්න උත්සාහ ගන්න ඕනෑ......

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ලිවීමට පුරුදු විය හැක්කේ

1) භාෂාවේ, අක්ෂර යෙදී ඇති අයුරු හැදෑරීමෙන්

උදා : තුළ, විලාසය

2) ඒ සඳහා ඇති රීති හැදෑරීමෙන්

ඉෂ්ඨ ප්‍රත්‍යය සහිත වචනවල "ඨ" කාරය යෙදේ.

**උදා : ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ**

නිවැරදි ලෙස ලිවීමට දැන ගත යුතු අක්ෂර වර්ග කිහිපයක් ඇත.

ක ච ට ත ප
ග ජ ඩ ද බ } අල්පප්‍රාණ

ඛ ඡ ඨ ථ ඵ
ඝ ඣ ඪ ධ භ } මහප්‍රාණ

**ක්‍රියාකාරකම 08**

i. පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අක්ෂරය තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| ලේ.......නය (ක /ඛ) | ප්‍ර...ඵලය (ති/ථි) | ප්‍ර....ල (බ/භ) |
| මජ්.....ම (ජි/ඣි) | සං...යනාව (ඝා/ගා) | ශිෂ්.... (ට/ඨ) |
| .....න්දදායකයා (ච/ඡ) | ප්‍රෞ... (ඩ/ඪ) | කනිෂ්... (ට/ඨ) |
| ස......ල (ප/ඵ) | | |

ii. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.

(අ) ........................... මිනිස්සු ලොව බොහෝ ඇත. (ආත්මාර්ථකාමී/ආත්මාර්තකාමී)

(ආ) ........................... නම් වෙළෙන්දකු ගැන සේරිවාණිජ ජාතකයේ දී කියවේ. (කච්චපුට/කච්ඡපුට)

(ඉ) විහාරස්ථානයේ පැවති පිරිත් .................. අතිමිහිරි ය. (සජ්ජායනාව/සජ්ඣායනාව)

(ඊ) ............................... දුම්රිය නුවර බලා පිටත් වේ. (සීග්‍රගාමී/ශීඝ්‍රගාමී)

(උ) මහ වැසි වැටීමෙන් ................. රැසක් විනාශ විය. (දන්‍යාගාර/ධාන්‍යාගාර)

පැවරුම

අල්පප්‍රාණ සහ මහප්‍රාණ අක්ෂරවලට සියලු ස්වර යෙදීමෙන්, ලැබෙන අක්ෂර සංකේත ඇතුළත් පොතක් නිර්මාණය කරන්න.